# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/13 - 2019 පෙබරවාරි මස 26 වැනි අඟහරුවාදා - 2019.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 පෙබරවාරි මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය,

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි අංක (6) "මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(6) මුදල් අමාත්‍ය" වශයෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 23 සිට 33 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 22 සිට නැවත අංකගත කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 40 සිට 49 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඉ) එහි II වැනි තීරුවෙහි අයිතම 39 සිට නැවත අංකගත කිරීමෙන්;

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)
- ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)
- ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5)
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)

(2) එම නිවේදනයෙහි (අංක 15) "වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අයිතම 17 සහ 18 ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 16 සිට නැවත අංකගත කිරීමෙන්;

(3) එම නිවේදනයෙහි (අංක 7) "රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 4 අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

5. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
6. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

(4) එම නිවේදනයෙහි අංක (16) "කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 24 සිට 26 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අයිතම 23 සිට නැවත අංකගත කිරීමෙන්;

(ඇ) එහි III වැනි තීරුවෙහි "ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)" ඉවත් කිරීමෙන්;

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන කරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 පෙබරවාරි මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි අංක "(4) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය, I වන, II වන සහ III වන තීරු සහ අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

(5) විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍ය

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. අමාත්‍ය මණ්ඩලය විසින් හඳුනාගත් කන්ද උඩරට විශේෂ ප්‍රදේශයන් හි සමාජ හා යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව ප්‍රතිපත්ති සකස් කිරීම, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. ග්‍රාමීය පුනර්ජීවන අරමුදල | ■ ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28) |
| 2. අධ්‍යාපන අමාත්‍යවරයාගේ එකඟතාවය මත විශේෂ ප්‍රදේශවල පාසල් ගොඩනැගිලි ඉදිකිරීම | 2. ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදල (මූල්‍ය) | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 3. මහාමාර්ග අමාත්‍යවරයාගේ එකඟතාවය මත විශේෂ ප්‍රදේශවල ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම | 3. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල) | |
| 4. හින්දු ආගමික කටයුතු අමාත්‍යවරයාගේ එකඟතාවය මත විශේෂ ප්‍රදේශවල හින්දු කෝවිල් සංවර්ධනය කිරීම | | |
| 5. සෞඛ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය මත විශේෂ ප්‍රදේශවල සෞඛ්‍ය සහ සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම | | |
| 6. කාන්තා කටයුතු අමාත්‍යවරයාගේ එකඟතාවය මත විශේෂ ප්‍රදේශවල | | |

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම සම්බන්ධීකරණය කිරීම | | |
| 7. ග්‍රාමීය ජන දිවිය නංවාලීම සඳහා මූලාධාර සම්පාදනය | | |
| 8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු | | |
| 9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(6) ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍ය

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ජනමාධ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>3. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br>4. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | ■ ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)<br>■ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)<br>■ ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5) |
| 2. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලන මය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම | 5. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය<br>6. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>7. සීමාසහිත ලංකා පුවත් ආයතනය | ■ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)<br>■ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5) |
| 3. ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 8. සැලසිනේ රූපවාහිනී ආයතනය<br>9. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව | ■ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6) |
| 4. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම | | ■ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12) |
| 5. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| --- | --- | --- |
| 6. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 7. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම | | |
| 8. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම | | |
| 9. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම | | |
| 10. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම | | |
| 11. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු | | |
| 12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 13. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

03 - 517/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.